සමාජය හා සාමයික කේන්ද්‍රය
சமூக சமய நடுநிலையம்
Centre for Society & Religion

281, Deans Road,
Colombo 10,
Sri Lanka.

Telephone : +94 0112 69 54 25 (General)
Fax : +94 0112 68 20 64
Web : www.csrsrilanka.org

**ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ පසු 2019 පාස්කු ඉරිද එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉෂ්ඨ කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැන සමාජය හා සාමයික කේන්ද්‍රය ( CSR) ජනාධිපතිවරණ අපේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන යෝජනා මාලාව**

සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR) යනු ආරම්භයේ සිටම පුරවැසියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කළ සහ මැදිහත්වීම් කළ ආයතනයකි. පාස්කු ඉරිදා ම්ලේච්ඡ ප්‍රහාරයෙන් පසු එහි වින්දිතයන්ගේ සුබසිද්ධිය උදෙසාත්, වගකීම් විරහිතව කටයුතු කළ නිලධාරීන් නීතිය හමුවට ගෙන ඒම උදෙසාත් සහ අපරාධකරුවන්ට නීතිමය පියවර ගැනීම උදෙසාත් අවශ්‍ය බලපෑම් කිරීමට සමාජය සහ සාමයික කේන්ද්‍රය ලෙස අපි කටයුතු කර ඇත්තෙමු. සිද්ධිය වූ වහාම සමාජය හා සාමයික කේන්ද්‍රයේ හිටපු අධ්‍යක්ෂ පියතුමා විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබූ අතර, හිටපු ජනාධිපතිවරයාට පවා වන්දි ගෙවන ලෙස නියෝග කළ පෙත්සම් 12න් එය ද එක් පෙත්සමකි. එතැන් සිට මේ දක්වා යුක්තිය ඉෂ්ඨ කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම, උද්ඝෝෂණ සිදු කිරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, ආණ්ඩුව සඟවාගෙන සිටින තොරතුරු හෙළිදරව් කිරීම, පොලිසියට පැමිණිලි කිරීම සහ අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු කටයුතු රැසක් සිදු කර තිබේ.

පාස්කු ඉරිදා එල්ල කළ ම්ලේච්ඡ ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ඨ කිරීම සඳහා ගත යුතු පියවර මොනවාද යන්න ගැන සමාජය හා සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම යෝජනාවලියක් සකස් කර තිබේ. ජනාධිපතිවරණයෙන් පසු කුමන අපේක්ෂකයා ජයග්‍රහණය කළ ද, මෙම ප්‍රහාරය සඳහා යුක්තිය ඉෂ්ඨ කිරීමට මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එසේ හෙයින් එය ක්‍රියාත්මක කිරීමේ මුල්ම පියවර ලෙස මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරණයට පෙරම එකඟත්වය පළකිරීම ද අතිශයින්ම වැදගත් වේ. එසේ හෙයින් ජනාධිපතිවරණයෙන් පසු මේ සඳහා යුක්තිය ඉෂ්ඨ කිරීමට අපේක්ෂකයන්ට

Executive Director :
Rev. Fr. Rohan Silva OMI
E - Mail : directorcsrcolombo10@gmail.com

Telephone : +94 0112 68 86 90
E - Mail : jrohansilva@gmail.com
Mobile : +94 0714 25 02 76

ඇති අභිප්‍රාය ජනාධිපතිවරණයට පෙරම ප්‍රකාශයට පත් කරන ලෙස ජනාධිපතිවරණයේ සියලුම අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිමු.

අප විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පහත දැක්වේ.

1. **සත්‍ය සෙවීම සහ පිළිගැනීම, විනිවිදබව**

■ පාස්කු ඉරිදා සිදුවූ ම්ලේච්ඡ ප්‍රහාරය ගැන සොයාබැලීම සඳහා පත් කළ කමිටු/කොමිෂන් සභා 03ක් මගින් මේ වන විට නිර්දේශ ලබාදී තිබේ. ඒවා නම් විජිත් මලල්ගොඩ විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුව, ජනක් ද සිල්වා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සහ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවයි. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට අදාළව සියලුම වෙළුම් (සාක්කි සහ අවසන් වාර්තාව) මේ වන විට ප්‍රසිද්ධ කර ඇතත් විනිසුරු මලල්ගොඩ කමිටුවේ සහ විනිසුරු ජනක් ද සිල්වා කොමිසමේ ප්‍රසිද්ධ කර ඇත්තේ අවසන් වාර්තා පමණි. සාක්කි සටහන් ඇතුළු සෙසු වෙළුම් මෙතෙක් ප්‍රසිද්ධියට පත් කර නැත. චැනල් ෆෝ නාලිකාවේ හෙළිදරව්ව සමග ඒ ගැන සොයා බැලීමට ජනාධිපතිවරයා විසින් කමිටුවක් පත් කරන ලද නමුත් එහි වාර්තාව සම්බන්ධයෙන් කිසිම තොරතුරක් වාර්තා වූයේ නැත. ඒ අනුව මෙම සියලුම කමිටු සහ කොමිෂන් සභාවලට අලාද සියලු වෙළුම්/වාර්තා උනන්දුවක් ඇති අයගේ පරිශීලනය සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

■ පාස්කු ඉරිදා එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරය සම්බන්ධයෙන් කමිටු සහ කොමිෂන් සභා තුනකින් සොයා බැලීම් කළ බව මීට පෙර සඳහන් කළෙමු. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි විමර්ශන ආයතන ද වෙනම විමර්ශන සිදු කළේය. විශේෂයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේදී සාක්කි මගින් අනාවරණය වූ ඇතැම් කාරණා එහි අවසන් වාර්තාවේ සඳහන් නොවීමත්, නවුෆර් මවුලවි වැනි වැදගත් සාක්කිකරුවන්ගෙන් සාක්කි ලබාගෙන නොතිබීමත්, එහි අවසන් වාර්තාව ලබා දුන් දිනයේ සිට මේ දක්වා අලුතෙන් අනාවරණය වූ කරුණු පිළිබඳවත් විශේෂ විමර්ශනයක් පවත්වා සත්‍ය තත්ත්වය සාක්කි සමග අනාවරණය කරගත යුතුව ඇත.

ඒ අනුව පූර්ණ බලැති කොමිෂන් සභාවක අවශ්‍යතාව පැන නැගී තිබේ. මෙම කාර්යය සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පත් කළ යුතුය. වඩාත් ඵලදායී වීම සඳහා එම කොමිෂන් සභාවට සාක්කි විභාගයේදී අනාවරණය වන කරුණු ඔස්සේ විමර්ශන පැවැත්වීමේ හැකියාව ද තිබිය යුතුය. මින් පසු අපරාධ යුක්තිය යන ශීර්ෂය යටතේ යෝජනා කරන විදේශ විමර්ශන කාර්යාලය මගින් එම විමර්ශන පැවැත්වීමට හැකියාව තිබිය යුතුය. එවැනි කටයුත්තකට ප්‍රතිපාදන නොමැති නම් පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කරමින් පුළුල් බලතල ඇති කොමිසමක්

පත්කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීමට යෝජනා කරමු. ඒ අනුව පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් සභාවක් පත්කිරීමත්, ඔවුන්ගේ පළමු කාර්යය ලෙස දැනට කොමිෂන් සභාවලට සහ පොලිසියේ විවිධ අංශවලට ලබාදී ඇති කටඋත්තර සහ සාක්කි සියල්ල පරීක්ෂා කර බලා විශ්ලේෂණය කළ යුතුබවට කොමිසමේ අධිකාරීපත්‍රයට ඇතුළත් කිරීමත් කළ යුතුව ඇත.

දෙස්-විදෙස් අපක්ෂපාතී විනිසුරුවරුන්ගෙන් සහ දෙස්-විදෙස් පරීක්ෂකයන්ගෙන් මෙන්ම නීති විශාරදයන්ගෙන් ද එම කොමිෂන් සභාව සහ එහි පර්යේෂණ ඒකකය සමන්විත විය යුතුය. එම කොමිසමේ සාමාජිකයන් ලෙස විදේශිකයන් පත්කිරීමට දැනට ප්‍රතිපාදන නොමැති නම් ඉතා කෙටි කාලයක් ඇතුළත ඊට අදාළ නීති සම්පාදනය/සංශෝධනය කර ගත යුතු වේ. කොමිසමේ සාමාජිකයන් පත්කරද්දී ඒ සඳහා මෙම ප්‍රහාරයට යුක්තිය අපේක්ෂා කරමින් මුල සිට කටයුතු කළ ආයතන, සංවිධාන සහ ක්‍රියාකාරිකයන් ලබාදෙන යෝජනා ද සැලකිල්ලට ගත යුතුය.

එම පරීක්ෂණ කොමිෂන් සභාවේ පහසුව සඳහා අවශ්‍ය හා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් ද, මූල්‍ය ප්‍රතිපාදන ද ලබා දිය යුතු වේ.

වැදගත්ම කාරණය වන්නේ කොමිෂන් සභාවේ සමස්ත සාක්කි විභාගය නිරීක්ෂණය කිරීම සඳහා දෙස්-විදෙස් නිරීක්ෂකයන්ට ආරාධනා කිරීමයි. මෙම සාක්කි විභාගය ජනමාධ්‍ය /සමාජ මාධ්‍ය ඔස්සේ සජීවීව විකාශය කිරීමට අවස්ථාව සැලසිය යුතු අතර, රහසේ ලබා ගත යුතු යැයි කොමිසම ඒකමතිකව තීරණය කරන සීමිත සාක්කි ප්‍රමාණයක් පමණක් සජීවී විකාශය කිරීමකින් තොරව ලබා ගත හැකිය.

■ පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයට අදාළ ව සිදුකරන සියලුම කටයුතු විනිවිදභාවයෙන් සිදුවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් වින්දිතයන්ට සහ සමස්තයක් ලෙස පුරවැසියන්ට දැනගැනීමට අවස්ථාව තිබිය යුතුය. ඒ අනුව නිශ්චිත කාලයකට වරක් ඒ වන විට පවතින සමස්ත තත්ත්වය ගැන තොරතුරු මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම ඊට අදාළ ව මහජනතාවට ඇති ප්‍රශ්නවලට පිළිතුරු දීමට අවශ්‍ය ක්‍රමවේදයක් ද සකස් කළ යුතුව ඇත.

පවතින තත්ත්වය සහ ගනිමින් සිටින ක්‍රියාමාර්ග ගැන ක්‍රමවත් ලෙස වින්දිතයන්ද ඇතුළු මහජනතාවට මාසයකට වරක්වත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ඕනෑම පුරවැසියකුට තේරුම් ගත හැකිවන පරිදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාල සිදුවීම්වල නඩුකටයුතු සම්බන්ධයෙන් ද අලුත්ම තොරතුරු එම වාර්තාවල අන්තර්ගත විය යුතුය.

2. හානිපූර්ණය

■ මෙම ප්‍රහාරයට අදාළව යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ එක් වැදගත්ම අංගයක් විය යුත්තේ හානි පූර්ණ සහ වින්දිතයන්ට ප්‍රමාණවත් සහන සැලසීමයි. එය ආර්ථික, සමාජයීය සහ මානසික සහන යන ක්ෂේත්‍ර තුනටමත් අදාළ විය යුතුය.

වින්දිතයන්ට සහන සැලසීම සඳහා හානි පූර්ණ කාර්යාල පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශවලත්, වින්දිතයන් හා සාක්කිකරුවන් ආරක්ෂා කිරීමේ පනතේත් ප්‍රමාණවත් නෛතික රාමුවක් තිබේ. සහන සැලසීමේ දී වින්දිතයන්ට සහ වින්දිත පවුල්වලට සිදුවූ හානියට සාපේක්ෂව ඔවුන්ගේ අවශ්‍යතාද සැලකිල්ලට ලක් කළ යුතුව ඇත. වින්දිතයන්ට සහන සැලසීමේ ක්‍රියාවලිය යථාවත් කිරීම සඳහා වින්දිතයන්ට සහ පවුල්වලට මෙම ප්‍රහාරයෙන් සිදුවූ ආර්ථික බලපෑම සොයාබැලීම සදහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ හැකි අතර, එමගින් ඒ ඒ පවුල් වෙත පිරිනැමිය යුතු වන්දි මුදල් සාධාරණ ලෙස සහ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි තීරණය කළ හැකිය.

■ එසේම පාස්කු විමර්ශන හේතුවෙන් පළිගැනීමකට ලක්වූ නිලධාරීන්ට යුක්තිය ඉෂ්ඨ කිරීම ද මෙහිලා වැදගත් වේ. ඒ අනුව අදාළ නිලධාරීන්ට සිදුවූ මානසික පීඩාවට අදාළව වන්දි ගෙවීමටත්, ඔවුන්ට අවශ්‍ය සහන සැලසීමටත් අදාළ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

■ පසුගිය කාලසීමාවේදී දේශපාලන හේතු මත පාස්කු ප්‍රහාරයට අදාළ බව කියමින් සැලකිය යුතු පිරිසක් අත්අඩංගුවට ගත් අතර, එලෙස අත්අඩංගුවට ගත් ඇතැමුන්ට එරෙහිව තවදුරටත් අධිකරණමය ක්‍රියාවලි සිදුවෙමින් තිබේ. ඇතැම් පිරිස් මාස ගණනක් රිමාන්ඩ් බාරයේ හෝ රැඳවුම් බාරයේ තබාගෙන සිටි බවට වාර්තා විය. පාස්කු ප්‍රහාරයට අදාළ ව යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ තවත් එක් වැදගත් කාර්යක් වන්නේ පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පසු දේශපාලන හේතු මත අත්අඩංගුවට ගත් පිරිසට සහන සැලසීම ය. ඔවුන්ට එරෙහි නඩු ඉවත් කර ගැනීම සහ ඔවුන්ට වෙනත් සහන ලබාදෙන ආකාරය ගැන පැහැදිලි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ යුතුය.

■ එසේම පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු රටේ ප්‍රදේශ කිහිපයක පහරදීම් සහ නිවාස ගිනිතැබීම් වැනි සිදුවීම් වාර්තා වූ අතර එම සිදුවීම්වලට ලක්වූවන්ට ද වන්දි ඇතුළු සහන ලබා දිය යුතුය.

3. අපරාධ යුක්තිය

■ වර්තමාන ක්‍රමය තුළ නීතිපතිවරයාගේ භූමිකාව බොහෝ කතාබහට ලක්ව තිබේ. ඊට හේතුව රජයේ නීති උපදේශක වූ නීතිපතිවරයා විටෙක වගඋත්තරකරුවන්ට එරෙහිව අධිකරණයේ පෙනී සිටින අතර තවත් විටෙන එම වගඋත්තරකරුවන්ට එරෙහි විමර්ශනවල අධීක්ෂකයා වෙයි. ඒක් උසාවියක වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටින නීතිපතිවරයා තවත් විටෙක එම වගඋත්තරකරුවන්ට එරෙහිව වෙනත් උසාවියක පෙනී සිටියි. නීතිපතිවරයාගේ භූමිකාව ළබැඳියාවන් අතර ගැටුමක් ඇති කර තිබේ. එසේ හෙයින් නඩු මෙහෙයවීම සඳහාත්, මීට පෙර සඳහන් කළ විශේෂ කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහායවීම සඳහාත් මින් පසු සඳහන් කරන විමර්ශන කාර්යාලයේ සොයා ගැනීම් අනුව නඩු පැවරීම සඳහාත් විශේෂ අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කළ යුතුය. එසේම එම කාර්යාලය සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැපයිය යුතුය.

■ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර යන නිලධාරීන් දෙදෙනාගේ අධීක්ෂණය යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ප්‍රහාරය ගැන මූලික අපරාධ විමර්ශන කළ අතර, ත්‍රස්ත මර්දන කොට්ඨාසය දෙහිවල ට්‍රොපිකල් ඉන් බෝම්බ ප්‍රහාරය ගැන විමර්ශන සිදු කළේය. අනතුරුව රවී සෙනෙවිරත්න සහ ශානි අබේසේකර යන නිලධාරීන් සහ මෙම විමර්ශනය සිදු කළ අනෙකුත් නිලධාරීන් ඉවත් කර 2019 වසරෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යළිත් විමර්ශනයක් සිදු කළේය. මෙම විමර්ශන දෙක ම මත පදනම්ව මේ වන විට මහාධිකරණවල සැකකරුවන් 90කට ආසන්න පිරිසකට එරෙහිව නඩු 41ක් පමණ පවරා තිබේ. එයින් නඩු දෙකක් පමණක් විභාග කර අවසන් වී තිබේ.

මෙම බෝම්බ ප්‍රහාරයෙන් වසර පහකටත් අධික කාලයක් ඉක්ම ගොස් ඇති මෙම කාල වකවානුව වන විට ප්‍රහාරයට අදාල තවත් සැක කටයුතු සිදුවීම් ගැන සමාජයේ කතාබහට ලක්වෙමින් තිබේ. සහරාන් හෂීම්ට ඉහළින් සිටි අබූ හින්ද් නම් පුද්ගලයකු ගැනත්, ප්‍රහාරකයන් සමග බුද්ධි අංශ සබඳතා පැවැත්වීම ගැනත් මේ වන විට කතාබහ වෙමින් තිබේ. මෙවැනි කාරණා ගැන මේ වන තෙක් අපරාධ විමර්ශනයක් පවත්වා නැත. එසේම ජනාධිපතිවරණ විමර්ශන කොමිෂන් සභාවේදී අනාවරණය වූ ඇතැම් කාරණා ගැන ද අපරාධ විමර්ශනයක් සිදුවී නැත. මෙම බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ, ඊට අධාර අනුබල දුන් සහ මෙහෙයවූ සියලුම පාර්ශ්ව සොයා අපරාධ පරීක්ෂණයක් සිදු කර ඔවුනට එරෙහිව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම ද වින්දිතයන්ට යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ වැදගත්ම අංගයකි.

2. හානිපූර්ණය

■ මෙම ප්‍රහාරයට අදාළව යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ එක් වැදගත්ම අංගයක් විය යුත්තේ හානි පූර්ණ සහ වින්දිතයන්ට ප්‍රමාණවත් සහන සැලසීමයි. එය ආර්ථික, සමාජයීය සහ මානසික සහන යන ක්ෂේත්‍ර තුනටමත් අදාළ විය යුතුය.

වින්දිතයන්ට සහන සැලසීම සඳහා හානි පූර්ණ කාර්යාල පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශවලත්, වින්දිතයන් හා සාක්කිකරුවන් ආරක්ෂා කිරීමේ පනතේත් ප්‍රමාණවත් නෛතික රාමුවක් තිබේ. සහන සැලසීමේ දී වින්දිතයන්ට සහ වින්දිත පවුල්වලට සිදුවූ හානියට සාපේක්ෂව ඔවුන්ගේ අවශ්‍යතාද සැලකිල්ලට ලක් කළ යුතුව ඇත. වින්දිතයන්ට සහන සැලසීමේ ක්‍රියාවලිය යථාවත් කිරීම සඳහා වින්දිතයන්ට සහ පවුල්වලට මෙම ප්‍රහාරයෙන් සිදුවූ ආර්ථික බලපෑම සොයාබැලීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ හැකි අතර, එමගින් ඒ ඒ පවුල් වෙත පිරිනැමිය යුතු වන්දි මුදල් සාධාරණ ලෙස සහ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි තීරණය කළ හැකිය.

■ එසේම පාස්කු විමර්ශන හේතුවෙන් පළිගැනීමකට ලක්වූ නිලධාරීන්ට යුක්තිය ඉෂ්ඨ කිරීම ද මෙහිලා වැදගත් වේ. ඒ අනුව අදාළ නිලධාරීන්ට සිදුවූ මානසික පීඩාවට අදාළව වන්දි ගෙවීමටත්, ඔවුන්ට අවශ්‍ය සහන සැලසීමටත් අදාළ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

■ පසුගිය කාලසීමාවේදී දේශපාලන හේතු මත පාස්කු ප්‍රහාරයට අදාළ බව කියමින් සැලකිය යුතු පිරිසක් අත්අඩංගුවට ගත් අතර, එලෙස අත්අඩංගුවට ගත් ඇතැමුන්ට එරෙහිව තවදුරටත් අධිකරණමය ක්‍රියාවලි සිදුවෙමින් තිබේ. ඇතැම් පිරිස් මාස ගණනක් රිමාන්ඩ් බාරයේ හෝ රැඳවුම් බාරයේ තබාගෙන සිටි බවට වාර්තා විය. පාස්කු ප්‍රහාරයට අදාළ ව යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ තවත් එක් වැදගත් කාර්යක් වන්නේ පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පසු දේශපාලන හේතු මත අත්අඩංගුවට ගත් පිරිසට සහන සැලසීම ය. ඔවුන්ට එරෙහි නඩු ඉවත් කර ගැනීම සහ ඔවුන්ට වෙනත් සහන ලබාදෙන ආකාරය ගැන පැහැදිලි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ යුතුය.

■ එසේම පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු රටේ ප්‍රදේශ කිහිපයක පහරදීම් සහ නිවාස ගිනිතැබීම් වැනි සිදුවීම් වාර්තා වූ අතර එම සිදුවීම්වලට ලක්වූවන්ට ද වන්දි ඇතුළු සහන ලබා දිය යුතුය.

එසේ හෙයින් මෙම සිදුවීමට අදාලව අපරාධ විමර්ශනයක් පැවැත්වීමටත්, ඒ මත විශේෂ අභියෝචක කාර්යාලයට නඩු පැවරීමටත් හැකිවන පරිදි පුළුල් බලතල සහිත විශේෂ විමර්ශන කාර්යාලයක් ස්ථාපනය කළ යුතු අතර එය මෙම සිද්ධිය ගැන සොයා බලන විශේෂ කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ සහ විශේෂ අභියෝචකගේ මගපෙන්වීම මත කටයුතු කරන ආයතනයක් විය යුතුය.

■ පාස්කු ඉරිදා ප්‍රහාරය වළක්වා ගැනීමට හැකියාව තිබියදී එය වළක්වා නොගත් නිලධාරීන් කිහිපදෙනකු මේ වන විටත් අනාවරණය වී තිබෙන අතර, ඔවුන්ට සහ ඉදිරියේදී අනාවරණය වන සෙසු පිරිසට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග සහ අපරාධ නීතිය යටතේ කටයුතු කළ යුතුය.

■ පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළ විමර්ශන තොරතුරු වෙනස් කිරීමට, සාක්ෂි වසන් කිරීමට සහ සත්‍ය හෙළිදරව් කරන්නන්ගෙන් පළිගැනීමට කටයුතු කළ සියලු නිලධාරීන්ට සහ දේශපාලනඥයන්ට එරෙහිව ද නෛතික ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

■ ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විභාග කිරීමේදී ගතවන කාලය සම්බන්ධයෙන් විවාදාපන්න තත්ත්වයක් තිබේ. එසේ හෙයින් පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයට අදාළ නඩු විභාග කඩිනම් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම යුක්තිය ඉෂ්ඨ කිරීමේ ක්‍රියාවලියේ වැදගත්ම අංගයක් ලෙස සැලකිය හැකිය.

**රොහාන් සිල්වා පියතුමා**
විධායක අධ්‍යක්ෂ
සමාජය හා සාමයික කේන්ද්‍රය
2024 සැප්තැම්බර 16 වැනි දා

දුරකතන අංකය - 0112 695 425
ඊමේල් - info@easterattack.info
ලිපිනය - 281, Deans Road, Colombo 10.